# සා. ස්නාවක ජොහන් මුනිතුමා ප්‍රාණපරිත්‍යාගි වීම

## අනිවාර්ය අනුස්මරණය

## පළමුවන දේව ප්‍රකාශනය ජෙරමියා 1: 17–19

*ජෙරමියා දිවැසිවරයාගේ පොතෙන් උපටා ගත් කොටසකි.*

"මා තුඹට අණ කරන සියල්ල ඔවුන්ට පවසන්න."

"තුඹ ධෛර්යවත් වී ගොස් මා තුඹට අණ කරන සියල්ල ඔවුන්ට කියන්න. ඔවුන් ඉදිරියෙහි දී මා තුඹ නොකලඹන පිණිස දැන් ඔවුන් ගැන නොකැලඹී සිටින්න. මෙන්න, මුළු දේශයට විරුද්ධ ව ද ජුදාහි රජවරුන්ටත්, අධිපතීන්ටත්, පූජකයන්ටත්, දේශයෙහි සෙනගටත් විරුද්ධ ව ද අද තුඹ සුරක්ෂිත නගරයක් ද යකඩ කුළුණක් ද ලෝකඩ පවුරක් ද මෙන් ශක්තිමත් කෙළෙමි. මන්ද, මම තුඹ සමඟ සිටින්නේමි. තුඹට විරුද්ධ ව ඔව්හු සටන් කරන්නෝ ය. එහෙත්, තුඹ පරාජය කරන්නට ඔවුන්ට නොහැකි ය. මෙසේ වදාරන්නේ ස්වාමින් වන මම ය."

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 71: 1–6, 15, 17

පිළිතුර : සමිඳුනි, ඔබ සාධාරණ බව අපි ප්‍රකාශ කරමු.

ගීය : අහෝ සමිඳුනි! සරණ පතා මම ඔබ වෙත පැමිණියෙමි.
කිසි කලක මා ලැජ්ජාවට පත් නොකළ මැනව!
ඔබේ සාධාරණකම නිසා මට පිහිට වී මා මුදාලුව මැනව!
මට සවන් දී මා ගැලෙවුව මැනව!
ඔබ මාගේ පර්වතය ද බලකොටුව ද වන බැවින්
ඔබ මට රැකවරණය දෙන පර්වතයක් වුව මැනව!

මා මුදාලන බලකාටුවක් වුව මැනව!
මාගේ දෙවිඳුනි! දුෂ්ටයන්ගේ බලයෙන් මා මුදාගත මැනවː
අපරාධකරුගේ ද දුදනාගේ ද ග්‍රහණයෙන් මා මිදුව මැනව!

මහෝත්තම දෙවි ස්වාමිනි, ඔබ මාගේ බලාපොරොත්තුව වන සේක.
සමිඳුනි, මාගේ තරුණ වියේ සිට මාගේ විශ්වාසය
මම ඔබ තුළ තැබුවෙමි.

උපන් දා සිට ඔබ මට පිහිට වූ සේකː
මවු කුසේ සිට ඔබ මා රැකගත් සේක.
මම ඔබ ගැන නිරතුරු ප්‍රශංසා කරන්නෙමි.
දවස පුරා ඔබේ සාධාරණ ක්‍රියා ද
ඔබේ විමුක්තිදායක ක්‍රියා ද මා මුවින් ප්‍රකාශ කරමි.

මන්ද, මම ඒවායේ ප්‍රමාණය නොදන්නෙමි.
අනේ දෙවිඳුනි! මාගේ තරුණ වියේ සිට
ඔබ මට උගන්වා වදාළ සේක.
මම අද දක්වා ඔබේ පුදුමාකාර ක්‍රියා වර්ණනා කෙළෙමි.

## සුපුවත් ජය නද
මතෙව් 5ː 10

ආලේලූයා! ආලේලූයා!
"යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝ යː
ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය.
ආලේලූයා!

## සුවිශේෂය

**මාක් 6: 17–29**

*සුවිශේෂක මාක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ඔබ කැමැති දෙයක් මාගෙන් ඉල්ලන්න."

හෙරෝද් සිය සොහොයුරා වන පිලිප්ගේ භාර්යාව වූ හෙරෝදියස් සරණ පාවාගත් බැවින්, ඇය නිසා මිනිසුන් යවා ජොහන් අල්ලා බැඳ හිර අඩස්සි කළේ ය. "ඔබේ සහෝදරයාගේ භාර්යාව තබාගැනීම ඔබට යුතු නැතැ"යි ජොහන් හෙරෝද්ට කී බැවින්, හෙරෝදියස් ඔහු කෙරේ වෛර බැඳ, ඔහු මරවන්නට අදහස් කරගෙන සිටියා ය. එහෙත් එය කළ නොහැකි විය. මන්ද, ජොහන් සත්ගුණවත් දැහැමි මිනිසෙකු බව හෙරෝද් දැන, ඔහුට බිය ව, ඔහු ආරක්ෂා කළ හෙයිනි. තවද, ඔහුගේ බස් අසා හෙරෝද් බොහෝ වියවුල් වුව ද සන්තෝෂයෙන් ඔහුට කන් දුන්නේ ය.

සුදුසු අවස්ථාවක් පැමිණියෙන්, හෙරෝද් සිය ජන්මෝත්සව දින, තමාගේ උසස් නිලධාරීන්ට ද ප්‍රධාන සේනාධිපතීන්ට ද ගලීලයේ ප්‍රභූවරයන්ට ද මංගල භෝජනයක් පිළියෙල කෙළේ ය. එවිට හෙරෝදියස්ගේ දුව එහි පිවිස රඟ පා, හෙරෝද්ගේ සහ ඔහු සමඟ භෝජන සංග්‍රහයට පැමිණ සිටි අමුත්තන්ගේ නෙත් සිත් පිනවූවා ය. එකල රජතුමා තරුණියට කතා කොට, "ඔබ කැමැති ඕනෑම දෙයක් මාගෙන් ඉල්ලන්න, එය ඔබට දෙමි"යි කී ය. තවද, "ඉල්ලන ඕනෑම දෙයක්, මාගේ රාජ්‍යයෙන් අඩක් වුවත්, ඔබට දෙමි"යි ඔහු ඇයට දිවුරුම් දුන්නේ ය. ඈ පිටතට ගොස්, "මම කුමක් ඉල්ලම් දැ"යි ඇගේ මවගෙන් ඇසුවා ය. "ස්නාවක ජොහන්ගේ හිස" යයි ඈ කීවා ය. එවිට තරුණිය වහා ම රජු වෙත පැමිණ, "ඔබ ස්නාවක ජොහන්ගේ හිස තැටියක ලා දැන් මට දෙනු මැනව"යි කීවා ය. රජතුමා අතිශයින් ශෝක විය. එහෙත්, ඔහුගේ දිවුරුම නිසා ද, අමුත්තන් නිසා ද, ඇට දුන් පොරොන්දුව කඩ කරන්න අකැමැති විය. එකෙණෙහි ම රජතුමා මුර සෙබළෙකු යවමින් ජොහන්ගේ හිස ගෙනෙන්න අණ කෙළේ ය. ඔහු ද ගොස් හිර ගෙයි දී ජොහන්ගේ හිස ගසාදමා එය තැටියක ලා ගෙනවුත්, තරුණියට දුන්නේ ය: තරුණිය ද එය මවට දුන්නා ය. ජොහන්ගේ ගෝලයෝ ඒ ගැන අසා අවුත්, ඔහුගේ මෘත දේහය ගෙන ගොස්, සොහොන් ගෙයක තැන්පත් කළහ.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*